48693



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

දේශපාලන විද්‍යාව I
அரசியல் விஞ்ஞானம் I
Political Science I

23 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

විභාග අංකය: ......................................

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යනුවෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
* **A** කොටස බහුවරණ ප්‍රශ්න **30** කින් සහ **B** කොටස කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න **20** කින් යුක්ත වේ.
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.
* එක් ප්‍රශ්නයකට ලකුණු **දෙක** බැගින් මුළු ලකුණු **100** කි.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 1 | 1 – 3 | |
| 2 | 4 – 11 | |
| 3 | 12 – 19 | |
| 4 | 20 – 25 | |
| 5 | 26 – 30 | |
| 6 | 31 – 36 | |
| 7 | 37 – 43 | |
| 8 | 44 – 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

## A කොටස

* අංක **1** සිට **20** තෙක් ඇති ප්‍රශ්නවලට **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරන්න.

**1.** දේශපාලනය
(1) රාජ්‍ය පරිපාලන කටයුතුවලට සීමා වන්නකි.
(2) සැමවිට ම සමාජ සුභසාධනය පිළිබඳව සැලකිලිමත් වෙයි.
(3) මැතිවරණ ක්‍රියාදාමයට සීමා වේ.
(4) පුරවැසියන් අතර පවතින සමාජ භාවිතයකි.
(5) සමාජයේ සදාචාරාත්මක ඇගයුම් අධ්‍යයනය කිරීමකි. (......)

**2.** දේශපාලන විද්‍යාව
(1) දේශපාලන බලය ලබාගැනීම අරමුණු කර ගනියි.
(2) රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය අධ්‍යයනය කිරීමට සීමා වේ.
(3) සමාජීය විද්‍යා ක්ෂේත්‍රයෙහි ශාඛාවකි.
(4) පක්ෂ දේශපාලනය අධෛර්ය කරයි.
(5) ව්‍යවහාර ඥානය මත පදනම් වේ. (......)

**3.** ව්‍යවස්ථානුකූලවාදය
(1) සංවරණ සහ තුලන මූලධර්මය යටපත් කරයි.
(2) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායට එරෙහිව යයි.
(3) දූෂණ සහ බලය අපහරණය කිරීම ප්‍රවර්ධනය කරයි.
(4) විධායකය සහ ව්‍යවස්ථාදායකය තුළ රාජ්‍ය බලය ඒකරාශී වීමට හැකියාව ලබා දෙයි.
(5) පුරවැසියන්ගේ මූලික අයිතීන් සහ නිදහස සුරක්ෂිත කරයි. (......)

[දෙවැනි පිටුව බලන්න.

**4.** සමාජ ප්‍රජාතන්ත්‍රවාදය
(1) සම්භවය ලැබුවේ 17වන සියවසේ දී ය.
(2) ලිබරල්වාදය සමඟ සමීපව සම්බන්ධ වී තිබිණි.
(3) බ්‍රිතාන්‍ය කොන්සර්වටිව් පක්ෂයේ දේශපාලන මතවාදය විය.
(4) ධනවාදය සහ සමාජවාදය යන දෙකෙහිම ලක්ෂණවල සංයෝගයකි.
(5) ආර්ථික අසමානතා අහෝසි කිරීමට ධනවාදයට පවතින හැකියාව විශ්වාස කළේ ය. (……)

**5.** නීතියේ ආධිපත්‍යය
(1) ආණ්ඩුවේ නිලධරතන්ත්‍රයේ ආධිපත්‍ය බලය සාධාරණය කරයි.
(2) ජාතික හදිසි අවස්ථාවල දී අත්තනෝමතිකව ක්‍රියා කිරීමේ හැකියාව ආණ්ඩුවට ලබාදෙයි.
(3) ආණ්ඩුවේ තීරණ සැමවිට ම බහුතරයේ කැමැත්ත පිළිබිඹු කළ යුතු බව අවධාරණය කරයි.
(4) දේශපාලන බලය වගවීමෙන් තොරව භාවිත කිරීම වැළැක්වීම අරමුණු කරයි.
(5) සමාජවාදයේ නෛතික සංකල්පයකි. (……)

**6.** රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ දී දේශපාලන පක්ෂවල කාර්යභාරයට ඇතුළත් වන්නේ,
(1) දේශපාලන බලය ලබා ගැනීම සඳහා පමණක් මහජන ගැටලු ප්‍රයෝජනයට ගැනීමයි.
(2) රාජ්‍ය ප්‍රතිපත්තිවල ප්‍රතිඵල පිළිබඳ පුරවැසියන්ට අවබෝධයක් ලබා දීමයි.
(3) ප්‍රතිපත්ති ක්‍රියාදාමය තුළ ජනතා සහභාගිත්වය සීමා කිරීමයි.
(4) රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය මගින් පෞද්ගලික අභිලාෂ ප්‍රවර්ධනය කිරීමයි.
(5) පක්ෂ නායකත්වය ප්‍රතිපත්ති විවාදවලට සම්බන්ධ වීම අධෛර්ය කිරීමයි. (……)

**7.** ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ මෑතකාලීන ප්‍රවණතාවලට ඇතුළත් වන්නේ,
(1) සාම්ප්‍රදායික පක්ෂ මතවාද අඛණ්ඩව පවත්වාගෙන යාමයි.
(2) ජනවාර්ගික-ආගමික පක්ෂ අතුරුදහන් වීමයි.
(3) සාම්ප්‍රදායික වාමාංශික පක්ෂවල ජනප්‍රියත්වය වර්ධනය වීමයි.
(4) සාම්ප්‍රදායික ප්‍රධාන පක්ෂ දෙක පිරිහීමට පත්වීමයි.
(5) පක්ෂ අභ්‍යන්තර ගැටුම් අඩු වීමයි. (……)

**8.** ශ්‍රී ලංකාවේ සමානුපාතික නියෝජන ක්‍රමයේ ප්‍රතිඵලයක් වන්නේ,
(1) නියෝජනය ලබා ගැනීමට කුඩා පක්ෂවලට වැඩි අවකාශ ලැබීමයි.
(2) මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා අඩු වීමයි.
(3) ජාතික ලැයිස්තුව හඳුන්වා දීමෙන් ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වීමයි.
(4) මැතිවරණ ප්‍රචාරණය සඳහා යොදවන වියදම් අඩු වීමයි.
(5) ජනවාර්ගික අනන්‍යතාව සහිත දේශපාලන පක්ෂ බිහිවීම වැළැක්වීමයි. (……)

**9.** ශ්‍රී ලංකාවේ පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (1972) මගින්
(1) රාජ්‍ය සේවය දේශපාලන විධායකයේ පාලනයෙන් නිදහස් කෙරිණ.
(2) රාජ්‍ය සේවකයන් පත්කිරීමේ හා මාරුකිරීමේ බලය කැබිනට් අමාත්‍යවරුන්ට පැවරිණි.
(3) රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලය අහෝසි කරන ලදී.
(4) රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය තහවුරු කිරීමට අවශ්‍ය ව්‍යවස්ථා ප්‍රතිපාදන හඳුන්වා දෙන ලදී.
(5) රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ ක්‍රියාවලිය නිර්දේශපාලනීය කෙරිණි. (……)

**10.** ජාතික අභිලාෂ සාධනය කරගැනීමට ජාත්‍යන්තර දේශපාලනය තුළ ඇති මාධ්‍යයක් වන්නේ,
(1) රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා ය.
(2) දේශපාලන පක්ෂ ය.
(3) බහුජාතික සමාගම් ය.
(4) ප්‍රභූ කණ්ඩායම් ය.
(5) සමාජ ව්‍යාපාර ය. (……)

**11.** නිදහසින් පසු ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය
(1) දකුණු ආසියානු කලාපයේ රාජ්‍යවල වැදගත්කම නොසලකා හැරියේ ය.
(2) සමාජවාදී මතවාදය මගින් මෙහෙයවනු ලැබිණ.
(3) හැඩගැසුණේ බලයට පත් පාලන තන්ත්‍රවල මතවාද සහ අභිලාෂවලිනි.
(4) ශ්‍රී ලංකාවේ උපායමාර්ගික පිහිටීමේ වාසිය සැමවිට ම නොසලකා හැර ඇත.
(5) එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති මගින් නිශ්චය කරනු ලැබ ඇත. (……)

[තුන්වැනි පිටුව බලන්න.

12. දේශපාලන විද්‍යාවේ චර්යාවාදී ප්‍රවේශය
(1) සම්භාව්‍ය ග්‍රීක යුගය දක්වා දිවෙන ඉතිහාසයකට හිමිකම් කියයි.
(2) ආනුභවික පර්යේෂණ සමග සම්බන්ධ විය.
(3) දේශපාලන ආයතනවල ඉතිහාසය අවධාරණය කරයි.
(4) ඇමෙරිකානු දේශපාලන විද්‍යාඥයින්ගේ සහාය ලබා ගැනීමට අසමත් විය.
(5) පුද්ගල දේශපාලන චර්යාව අධ්‍යයනය කිරීම නොසලකා හරියි. (......)

13. ආණ්ඩුව
(1) රාජ්‍යයට වඩා දිගුකාලීන පැවැත්මක් සහිත ය.
(2) සමාජයේ දේශපාලන බලයේ කේන්ද්‍රීය ආයතනයයි.
(3) රාජ්‍යයේ මූලික ආයතනික නියෝජිතයා ය.
(4) ජාතියේ බාහිර ස්වාධිපත්‍යට හිමිකම් කියයි.
(5) රාජ්‍යය යන සංකල්පයට සමාන අර්ථයක් දෙයි. (......)

14. ඉන්දියානු නිරාගමිකවාදයෙන් අදහස් කරනුයේ,
(1) සෑම ආගමක් ම රාජ්‍ය ආගම් ලෙස සැලකීමයි.
(2) රාජ්‍යය සියලු ආගම්වලට අපක්ෂපාතව සැලකීමයි.
(3) සියලු පුරවැසියන්ගේ ජනවාර්ගික අනන්‍යතාවලට ගරු කිරීමයි.
(4) සුළුතර ආගම්වලට විශේෂ සැලකිලි දැක්වීමයි.
(5) ආගමික ඉගැන්වීම් සම්බන්ධ මතභේද විසඳීමට ආණ්ඩුව මැදිහත් වීමයි. (......)

15. ලිබරල්වාදය
(1) රාජ්‍යය පවතින්නේ පන්ති සහිත සමාජ තුළ බවට තර්ක කරයි.
(2) පුරවැසියන්ගේ පුද්ගලික නිදහස සුරක්ෂිත කිරීම අරමුණ කරගනියි.
(3) වෙළෙඳ කටයුතු තුළ රාජ්‍යයේ මැදිහත්වීම ප්‍රවර්ධනය කරයි.
(4) මාක්ස්වාදීන්ගේ සහයෝගය ලැබූ දේශපාලන මතවාදයකි.
(5) සිවිල් සමාජ ක්‍රියාකාරිත්වය අධෛර්යයට පත් කරයි. (......)

16. ස්විස්ටර්ලන්තය
(1) සතු ආණ්ඩුක්‍රමය, අර්ධ සන්ධීය යැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ප්‍රකාශිත ය.
(2) දියුණු සන්ධීය ක්‍රමයක් පවතින සාපේක්ෂ වශයෙන් විශාල රටකි.
(3) හවුල් පාලනයට (shared-rule) සහ ස්වයං පාලනයට (self -rule) ඉඩ සපයන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මූලධර්මයක් සහිත රටකි.
(4) කැන්ටන් ඒකකවලට ස්වයං පාලන බලතල ලබා නොදෙයි.
(5) සතුව තිබෙන්නේ ඒක මාණ්ඩලික ව්‍යවස්ථාදායකයකි. (......)

17. ඇමෙරිකානු එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
(1) බලතල වෙන්කිරීමට ඉඩ සලසන්නේ නැත.
(2) සමූහාණ්ඩුවාදය ප්‍රතික්ෂේප කොට ඇත.
(3) පෙර පැවති ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අහෝසිකොට පිහිටුවනු ලැබ ඇත.
(4) විදේශ රාජ්‍ය සමග ගිවිසුම්වලට එළැඹීමට ප්‍රාන්තවලට බලය ලබා දී ඇත.
(5) මධ්‍යම ආණ්ඩුවෙහි බලතල පමණක් දක්වා සිටියි. (......)

18. ජනාධිපති ආණ්ඩුක්‍රමයට අදාළ මූලධර්මය වන්නේ,
(1) විධායකය සහ ව්‍යවස්ථාදායකය සඳහා වෙන් වෙන්ව මැතිවරණ පැවැත්වීමයි.
(2) විධායකය එහි පැවැත්ම සඳහා ව්‍යවස්ථාදායකය මත පදනම් වීමයි.
(3) ජනාධිපතිවරයා රාජ්‍යයේ නායකයා නොවීමයි.
(4) විධායකයේ සහ ව්‍යවස්ථාදායකයේ නිල කාලය එකවර අවසන් වීමයි.
(5) ජනාධිපතිවරයා ධුරයෙන් ඉවත් කිරීම සාපේක්ෂ වශයෙන් පහසු ක්‍රියාදාමයක් වීමයි. (......)

19. වෙස්ට්මින්ස්ටර් මාදිලියේ ආණ්ඩුක්‍රමය
(1) ප්‍රංශ ආණ්ඩුක්‍රමයට සමාන වේ.
(2) රාජ්‍ය නායකයා මහජන ඡන්දයෙන් තෝරා පත්කර ගැනීමේ ප්‍රතිපාදන සහිත වේ.
(3) පාර්ලිමේන්තුවේ නීති සම්පාදන බලය උත්තරීතර කොට සලකයි.
(4) නීති අධිකරණ විමර්ශනයට ලක් කිරීමට ඉඩ සලසයි.
(5) කැබිනට් අමාත්‍යවරුන්ගේ සාමූහික වගකීමට අවකාශ ලබා නොදෙයි. (......)

[හතරවැනි පිටුව බලන්න.

**20.** ශ්‍රී ලංකාවේ ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
(1) සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දුන්නේ ය.
(2) ආණ්ඩුකාරවරයා අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා බවට පත් කළේ ය.
(3) ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුක්‍රමයක් සඳහා පදනම දැමී ය.
(4) වාර්ගික නියෝජනය ප්‍රවර්ධනය කළේ ය.
(5) ස්ත්‍රීන්ට ඡන්ද අයිතිය ලබාදීම ප්‍රතික්ෂේප කළේ ය. (......)

- අංක **21** සිට **25** තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරෙන් **නිවැරදි ප්‍රකාශ කාණ්ඩය** ඇතුළත් වරණය තෝරන්න.

**21.** සෝල්බරි ව්‍යවස්ථාවේ වෙස්ට්මින්ස්ටර් ලක්ෂණ වූයේ,
A - අග්‍රාණ්ඩුකාරවරයා නාමමාත්‍ර විධායකයා වීම ය.
B - දේශපාලන විධායකය පාර්ලිමේන්තුව මගින් තෝරා පත්කර ගැනීම ය.
C - ව්‍යවස්ථාදායකය ද්වි-මාණ්ඩලික වීම ය.
D - අග්‍රාමාත්‍යවරයා කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වීම ය.
E - අග්‍රාණ්ඩුකාරවරයා පාර්ලිමේන්තුවට වගකිව යුතු වීම ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

**22.** ශ්‍රී ලංකාවේ 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය
A - සිවිල් සහ දේශපාලන අයිතීන් සහතික කරයි.
B - මූලික අයිතිවාසිකම් කඩවීම සම්බන්ධව ඕනෑම අධිකරණයකට පෙත්සම් ඉදිරිපත් කිරීමට පුරවැසියන්ට අවස්ථාව සලසයි.
C - මූලික අයිතිවාසිකම් නඩු විභාග කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට ලබා දෙයි.
D - සාමූහික සහ සමාජ අයිතීන් ඇතුළත් නොවීම නිසා විවේචනයට ලක් වේ.
E - හදිසි අවස්ථාවක් පැනවූ විට මූලික අයිතිවාසිකම් මත සීමා ඇති කරයි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

**23.** සාමය ගොඩනැගීම
A - බිම් මට්ටමේ සාම ප්‍රයත්න පමණක් ප්‍රවර්ධනය කරයි.
B - එක් එක් රටවල සුවිශේෂ තත්ත්වයන්ට අනුව සකස් වේ.
C - දිග්ගැස්සුණු ගැටුම් සිදුවන සමාජයන්හි තිරසර සාමය අවධාරණය කරයි.
D - පුරවැසියන් සහ සිවිල් සමාජ ව්‍යාපාරවල සහභාගිත්වය අවධාරණය කරයි.
E - සාධනීය හා නිෂේධනීය සාමය (positive and negative peace) යන දෙඅංශයෙන් ම සමන්විත වේ.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

**24.** ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (1972) යටතේ පැවැති ව්‍යවස්ථාදායකය
A - අධිකරණ අධීක්ෂණයට යටත් නොවී ය.
B - රාජ්‍ය බලයේ උත්තරීතර ආයතනය ලෙස සැලකිණි.
C - බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ආකෘතියෙන් වෙනස් විය.
D - ද්වි මාණ්ඩලික විය.
E - නිල වශයෙන් හඳුන්වන ලද්දේ ජාතික රාජ්‍ය සභාව ලෙස ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

**25.** ඇමෙරිකානු සන්ධීය ආණ්ඩු ක්‍රමය
A - ප්‍රාන්ත රාජ්‍යවල ස්වායත්තතාව යන අදහස මත පදනම් ව ගොඩනැගිණි.
B - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සඳහා ප්‍රාන්ත ව්‍යවස්ථාදායකවල අනුමැතිය අවශ්‍ය බව කියයි.
C - මධ්‍යම සහ ප්‍රාන්ත ආණ්ඩුවලට සමගාමී බලතල ලබා නොදෙයි.
D - ද්වි-මණ්ඩල ව්‍යවස්ථාදායකයක් නිර්මාණය කර ඇත.
E - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීතරත්වය මූලික පදනම් මූලධර්මයක් වශයෙන් සලකයි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

- අංක **26** සිට **30** තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4) සහ (5) යන වරණවලින් කවර වරණය දැ'යි තෝරා, එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

| අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය | සත්‍ය |
| (2) | සත්‍ය | අසත්‍ය |
| (3) | අසත්‍ය | සත්‍ය |
| (4) | අසත්‍ය | අසත්‍ය |
| (5) | සත්‍ය | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තවදුරටත් විස්තර කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| **26.** | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අධිකරණයෙන් දඬුවම් ලැබූ වරදකරුවකුට සමාව ප්‍රදානය කිරීමේ බලය තිබෙන්නේ ජනාධිපතිවරයාට පමණි. | එම සමාව ප්‍රදානය කිරීමේ බලය ක්‍රියාත්මක කිරීමට පෙර ජනාධිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයේ උපදෙස් ලබාගත යුතු ය. | (……) |
| **27.** | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරාගනු ලබන්නේ මැතිවරණ දිස්ත්‍රික්ක පදනම් කරගෙන ය. | ශ්‍රී ලංකාවේ මූලික අයිතිවාසිකම්, වාර්ගික සහ ආගමික සාමය මෙන් ම ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීමට පනවා ඇති නෛතික සීමාවන්ට යටත් වේ. | (……) |
| **28.** | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවැනි සංශෝධනයට අනුව, පාර්ලිමේන්තු සභාව සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වේ. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවැනි සංශෝධනයට අනුව, පාර්ලිමේන්තු සභාවේ සාමාජිකයන් අතර, සිවිල් සමාජයේ නියෝජිතයන් නැත. | (……) |
| **29.** | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුවේ සැසි වාර අවසන් කිරීමේ බලය තිබෙන්නේ කථානායකවරයාට ය. | පාර්ලිමේන්තුව විසිර වූවාට පසු ජනාධිපතිවරයා විසින්, ඊළඟ පාර්ලිමේන්තු මැතිවරණය සඳහා දිනයක් නියම කිරීම අනිවාර්ය නොවේ. | (……) |
| **30.** | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වැනි සංශෝධනය යටතේ, පළාත් ආණ්ඩුකාරවරයා පත් කරනු ලබන්නේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විසිනි. | පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් නම් කිරීමේ බලතල තිබෙන්නේ ප්‍රධාන අමාත්‍යවරයාට ය. | (……) |

## B කොටස

**31.** දේශපාලනය පිළිබඳ තුලනාත්මක අධ්‍යයන ප්‍රවේශයේ සම්ප්‍රදාය තුනක් තිබේ. එයින් **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

**32.** ලෝකයේ දේශපාලන පක්ෂ ක්‍රම කිහිපයක් තිබේ. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

**33.** දේශපාලන සහ සමාජ න්‍යාය තුළ සිවිල් සමාජය යන සංකල්පය අර්ථ හතරකින් භාවිත වේ. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

**34.** රාජ්‍යය යනු සමාජයේ ඇති මානව සංවිධාන අතුරෙන් ඉහළම සංවිධානය යන අදහස දක්වන දේශපාලන න්‍යායික ධාරා දෙකක් දේශපාලන චින්තකයන් දෙදෙනෙකු සමඟ අනන්‍ය වී ඇත. එම ධාරා **දෙක** මොනවා ද?

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

**35.** (1) ස්ත්‍රීන් දේශපාලන ක්ෂේත්‍රයෙන් බැහැර කිරීම ප්‍රශ්න කරන්නේ දේශපාලන අධ්‍යයනයේ ඇති කවර ප්‍රවේශයෙන් ද?

..........................................................................................................

(2) ආර්ථික සහ සමාජ පන්ති යන සාධක මගින් දේශපාලනය තීරණය කරන බව සැලකෙන්නේ කවර දේශපාලන අධ්‍යයන ප්‍රවේශයෙන් ද?

..........................................................................................................

**36.** (1) නීතිය සියලු පුද්ගලයින් සඳහා එක සමාන ලෙසින් ක්‍රියාත්මක කළ යුතු ය යන අදහස අවධාරණය කරන නීතියේ ආධිපත්‍යයට (Rule of Law) අයත් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මය කුමක් ද?

..........................................................................................................

(2) ආණ්ඩුවේ බලය එක ආයතනයක් වෙත කේන්ද්‍රගත වීම වැළැක්වීමට ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමවල භාවිත කරන මූලධර්මය කුමක් ද?

..........................................................................................................

[හත්වැනි පිටුව බලන්න.

**37.** (1) ඉන්දියානු ආණ්ඩුක්‍රමය සකස් වී ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මාදිලිය කුමක් ද?

.................................................................................................

(2) ප්‍රංශ ආණ්ඩුක්‍රමය සකස් වී ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මාදිලිය කුමක් ද?

.................................................................................................

**38.** නිලබල ක්‍රමය පිළිබඳ මැක්ස් වෙබර්ගේ න්‍යාය තුළ ආධිපත්‍ය ක්‍රම තුනක් තිබේ. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1) .................................................................................................

(2) .................................................................................................

**39.** (1) ශ්‍රී ලංකාවේ මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුව බලයට පත් වූයේ කුමන වසරේදී ද? ..................

(2) ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විසිවන සංශෝධනය හඳුන්වා දුන්නේ කුමන වසරේදී ද? ............

**40.** 1833 දී ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමයට සහ අධිකරණ පරිපාලනයට ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කළ කොමිෂන් සභාවේ සාමාජිකයන් **දෙදෙනා** නම් කරන්න.

(1) .................................................................................................

(2) .................................................................................................

**41.** ශ්‍රී ලංකාවේ 1978 ව්‍යවස්ථාවෙහි 13 වන සංශෝධනය යටතේ හඳුන්වා දුන් බලය විමධ්‍යගත කිරීමේ ක්‍රමය තුළ බලතල ලැයිස්තු තුනක් තිබේ. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1) .................................................................................................

(2) .................................................................................................

**42.** රාජ්‍ය ස්වාධිපත්‍යයෙහි ඇති පැතිකඩ **දෙක** නම් කරන්න.

(1) .................................................................................................

(2) .................................................................................................

**43.** 1947 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව ආයතන තුනකින් සමන්විත විය. නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ඉන් එකකි. අනෙක් ආයතන **දෙක** කවරේ ද?

(1) .................................................................................................

(2) .................................................................................................

[අටවැනි පිටුව බලන්න.

**44.** (1) නූතන ජාතික රාජ්‍ය ක්‍රමයේ ආරම්භය දාහත්වැනි සියවසේ දී යුරෝපයේ අත්සන් කරන ලද සාම ගිවිසුමක් මත පදනම් විය. එම ගිවිසුම නම් කරන්න.

..........................................................................................................

(2) කුඩා රාජ්‍යයන් ලෝකයේ මහ බලවතුන්ගෙන් අපක්ෂපාතව සිටිය යුතු ය යන මූලධර්මය අවධාරණය කළ විදේශ ප්‍රතිපත්ති ප්‍රවේශය නම් කරන්න.

..........................................................................................................

**45.** (1) ලෝකය බල කඳවුරු දෙකකට බෙදුණු ලෝක ක්‍රමය විස්තර කෙරෙන සංකල්පය කුමක් ද?

..........................................................................................................

(2) තනි ලෝක බලවතෙකු සහිත ලෝක ක්‍රමය විස්තර කෙරෙන සංකල්පය කුමක් ද?

..........................................................................................................

**46.** ගැටුම් වැළැක්වීමේ ක්‍රම දෙකක් තිබේ. ඒවා මොනවා ද?

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

**47.** රාජ්‍ය ප්‍රතිපත්ති හැදෑරීම දෙයාකාර ස්වභාවයක් ගනී. ඒවා මොනවා ද?

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

**48.** (1) රාජ්‍යය රහිතව පෙර පැවති මනුෂ්‍යයන් ජීවත් වූ තත්ත්වය හැඳින්වීමට සමාජ සම්මුතිවාදී න්‍යාය භාවිත කළ සංකල්පය කුමක් ද?

..........................................................................................................

(2) ලිබරල්වාදී දේශපාලන න්‍යායේ ආරම්භක දේශපාලන දාර්ශනිකයා නම් කරන්න.

..........................................................................................................

**49.** (1) රාජ්‍ය වන්දනය අවධාරණය කළ විසිවන සියවසේ දේශපාලන මතවාදය කුමක් ද?

..........................................................................................................

(2) තෝමස් හොබ්ස් විසින් රචනා කරන ලද දේශපාලන න්‍යායට අයත් කෘතිය නම් කරන්න.

..........................................................................................................

**50.** මතවාදයක් ලෙස ජාතිකවාදය හඳුනාගත හැකි ප්‍රවේශ තුනක් තිබේ. ඉන් **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

* * *

AL/2021(2022)/23/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

**දේශපාලන විද්‍යාව II**
அரசியல் விஞ்ஞானம் II
Political Science II

**23 S II**

**පැය තුනයි**
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

※ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත ය.

※ **I** කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද, **II** කොටසින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, **III** කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** දේශපාලනය අධ්‍යයනය කිරීම සඳහා ඇති සමාජ විද්‍යාත්මක ප්‍රවේශය විස්තර කරන්න. (ලකුණු 20)

**2.** (i) 'දේශපාලන මතවාද' යන සංකල්පය අර්ථ දක්වන්න. (ලකුණු 05)

(ii) දේශපාලන මතවාදයක් ලෙස සමාජවාදය විස්තර කරන්න. (ලකුණු 15)

**3.** (i) 'රාජ්‍යය' යන සංකල්පය අර්ථ දක්වන්න. (ලකුණු 05)

(ii) රාජ්‍යය, සමාජය තුළ ඉටු කරන භූමිකාව පැහැදිලි කරන්න. (ලකුණු 10)

(iii) ආණ්ඩුව රාජ්‍යයෙන් වෙනස් වන්නේ කෙසේ ද? (ලකුණු 05)

## II කොටස

**4.** (i) ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන කාලය තුළ සිදු වූ **ආර්ථික** පරිවර්තනය කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ii) බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන කාලය තුළ ශ්‍රී ලංකාවෙහි සිදු වූ පරිවර්තනයෙහි තිබුණු **සමාජීය** පැතිකඩ විස්තර කරන්න. (ලකුණු 10)

**5.** (i) සුළුතර වාර්ගික ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධව සෝල්බරි ව්‍යවස්ථාවේ තිබූ විධිවිධාන කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

(ii) ඉහත (i) හි ඔබ සඳහන් කළ විධිවිධානවල අපේක්ෂිත අරමුණු ඉටු වී දැයි කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

**6.** ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ජනාධිපති ධුරයේ බලතල සම්බන්ධයෙන් පහත සඳහන් සංශෝධන මගින් සිදු කරන ලද වෙනස්කම් පෙන්වා දෙන්න.

(i) 18වන සංශෝධනය (ලකුණු 10)

(ii) 19වන සංශෝධනය (ලකුණු 10)

[පෙරළිය බලන්න

7. (i) 'ගැටුම' යන සංකල්පය අර්ථ දක්වන්න. (ලකුණු 05)

(ii) ගැටුම් වර්ගීකරණය කර ඇති ආකාරය නිදසුන් සහිතව පෙන්වා දෙන්න. (ලකුණු 10)

(iii) ගැටුම් සමථන මාධ්‍යයක් ලෙස සහමන්ත්‍රණය (negotiation) යන සංකල්පය ලුහුඬින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

## III කොටස

8. ප්‍රංශයේ ඩිගොල්වාදී ආණ්ඩුක්‍රමයේ ඇති ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 20)

9. (i) 'රාජ්‍ය ප්‍රතිපත්ති' යන්න නිර්වචනය කරන්න. (ලකුණු 05)

(ii) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාදාමයේදී දේශපාලන විධායකය සහ ස්ථිර විධායකය සතු භූමිකාව පැහැදිලි කරන්න. (ලකුණු 15)

10. පහත සඳහන් ඕනෑම මාතෘකා **දෙකක්** පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියට බලපාන සාධක

(ii) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ

(iii) ජාත්‍යන්තර දේශපාලනයේ රාජ්‍ය ක්‍රියාධරයෝ

(iv) ඉන්දීය ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ

(v) දේශපාලන පක්ෂවල කාර්යයන් (ලකුණු $10 \times 2 = 20$)

* * *